**නානාට්ටාන් ප්‍රාදේශීය සභාව**
**මන්නාරම දිස්ත්‍රික්කය**
**----------------------------**

# 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තම්බර් 11 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට නානාට්ටාන් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලි ආදායම් රු. 368,333 ක් ලැබී තිබුණද, ආදායම් වියදම් ගිණුමේ එය රු. 561,973 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් ඉක්මවූ ආදායම් රු. 193,630 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

**විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම**

එකතු වටිනාකම් රුපියල් මිලියන 146.05 ක්වූ දේපළ දෙකක් සම්බන්ධයෙන් ඉඩම් ඔප්පු ණය කාල විශ්ලේෂණ ඉදිරිපත් නොවීමෙන් එම වත්කම් සම්බන්ධයෙන් විගණයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.4 අනුකූල නොවීම**

**-------------------**

**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**-------------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| මුදල් රෙගුලාසි 571 | 691,029 | කල් ඉකුත්වූ තැන්පත් 38 ක් සම්බන්ධයෙන් කටයුතු නොකර පසුගිය වර්ෂ 03 ක සිට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. |
| (ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| (i) 2017 අප්‍රේල් 19 දින හා අංක 30/2017 | | ඇඟිලි සැලකුණු යටහත් කිරීමේ යන්ත්‍රය භාවිතාකරමින් රජයේ නිලධාරින්ගේ දෛනික පැමිණීම් සහ පිටවීම් සනාථ කරන වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 2008 පෙබරවාරි 06 දිනැති අංක 2008/05 | | මහජන ප්‍රඥප්ති දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි යන ත්‍රෛභාෂාවෙන් ප්‍රදර්ශනය කර නොතිබුණි. |

**2 මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු. 2,939,055 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 8,119,549 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**-----------------------**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

**-------------------------------------------------------------------------------------**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | --------- | ------------- | --------------- | ------------- | ------------- | ------------- | ------------- | ------------- | ------------- |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 411,000 | - | 472,910 | - | 460,000 | - | 366,462 | - |
| (ii) | කුලී | 6,352,055 | - | 5,866,244 | - | 6,095,995 | - | 7,833,168 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 670,000 | - | 575,769 | - | 620,000 | - | 724,964 | - |
| (iv) | වෙනත් ආදායම් | 4,004,484 | - | 4,840,218 | 3,440,396 | 3,768,250 | - | 5,457,211 | 2,849,064 |

**2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 528,000 ක් හා මුද්දර ගාස්තු රු. 946,470 ක් විය.

**2.2.3 කුලී**

සභාවට අයත් මහජන පොළ කඩ කාමර, තැපැල් ගොඩනැගිල්ලේ බදුකරුවන්ගෙන් අයවියයුතු හිඟ මුදල රු. 245,560 ක් අයකර ගැනීමට වර්ෂ 01 සිට වර්ෂ 07 දක්වා සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචිතය**

**3.1 කාර්‍යසාධනය**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

පළාත් නිශ්චිත ආධාර - 2015 සැලසුම් යටතේ තේක්කම් යන ස්ථානයේ එකතුව රුපියල් මිලියන 05 ක් වැයකර තේක්කම් සංචාරක කේන්ද්‍ර භෝජනාගාරය ඉදිකර වර්ෂයකට අධික කාලයක් ගතවී තිබුණද, අපේක්ෂිත අරමුණ ඉටුකිරීමට සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) කසල බැහැර කරන ස්ථානයන් සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ii) සෞඛ්‍ය කම්කරුවන් වාර්ෂිකව වෛද්‍ය පරීක්ෂවලට භාජනයකර නොතිබුණි.

(iii) අපද්‍රව්‍ය වර්ගීකරණය කර ලබා ගෙන නොතිබුණි.

(iv) සභාවේ කසල එකතුකරන ස්ථානවලට ගෙන එන කසල වර්ගීකරණය කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙලක් සකසා නොතිබුණි.

(v) අපද්‍රව්‍ය කළමනාකරණ පිළිබඳ නිලධාරින්ට පුහුණු ලබාදී නොතිබුණි.

(vi) අපද්‍රව්‍ය කළමනාකරණයට අවශ්‍ය තොරතුරු සහ දත්ත ක්‍රමයක් පවත්වා නොතිබුණි.

(vii) සණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණයෙන් තොරව පරිසරය දූෂණය වන ආකාරයට ගිණි තබා පුළුස්සනු ලැබේ.

(viii) සණ අපද්‍රව්‍ය කළමනාකරණ සඳහා අතුරු ව්‍යවස්ථාවන් පනවා නොතිබුණි.

(ix) සභා අරමුදලින් කසල කළමනාකරණ සඳහා වැයවන මුදල් ප්‍රමාණය රැස්කර ගැනීම සඳහා කසල බදු අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(x) සභා බල ප්‍රදේශයේ තිබෙන කඩ සහ නිවස්වලින් කසල වර්ගීකරණය කර මලුවල දමා ගෙනයාම සඳහා කටයුතු කර නොතිබුණි.

**(ආ) අත්හැරුණු ක්‍රියාකාරකම්**

**---------------------------**

සමාලෝචිත වර්ෂයේ අයවැය මගින් සහා අරමුදලින් ඉටුකිරීම සඳහා එකතුව රු. මිලියන 76 ක් වටිනාකමට ඇස්තමේන්තු කරන ලද ප්‍රාග්ධන සහ සුභ සාධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණද, එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සභාව විසින් ගෙන නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

**------------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතවලින් නිවස 421 ක ඉදිකර තිබුණද, සභාවේ ආදායම් පරික්ෂණකරුවන් විසින් ඒවා පරික්ෂාකිරීමට අපොහොසත්වීමෙන් නිවස් 289 කින් අයකරගතයුතු ක්‍රියාවලි ආකෘතිපත්‍ර සහ පරික්ෂණ ගාස්තුවල එකතුව රු. 606,900 ක් අයකර ගැනීම සඳහා සභාවට නොහැකිවී තිබුණි.

(ආ) සභාව සතු මුරුන්කන් පොළ වෙළඳ සංකීර්ණයේ කඩකාමර 32 කින් කඩ කාමර 20 ක බදුකරුවන් විසින් බදු ගිවිසුමට පටහැනිව විදුලි බිල්පත් ගෙවීම නිසි ලෙස සිදු නොවූබැවින් කඩ කාමර 12 ක විදුලි මනු ලංකා විදුලි බල මණ්ඩල විසින් ඉවත්කර කඩ කාමර 08 ක විදුලි සම්බන්ධතාවය විසන්ධිකර තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

**------------------------------------**

සමාලෝචිත වර්ෂයතුලදී කාර්ය මණ්ඩලය පුරප්පාඩු 6 ක් පුරවා නොතිබීමෙන්, එම අයගෙන් ඉටුකරගතයුතු වැඩවලට බාධාවන් වී තිබුණි.

## 4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

**----------------------------------------**

## 4.1 අභ්‍යන්තර විගණනය

**-----------------------**

සභාවේ කටයුතු විගණනය කර එහි ක්‍රියාකාරකම් කාර්යක්ෂමතාවයෙන් කරගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන පරික්ෂණ වලින් ලද නිර්දේශයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**4.2 අයවැය පාලනය**

**--------------------**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය වියදම් අතර රු. 806,452 ක හිතකර විචලනයක් නිරීක්ෂණය විය.

**5 පද්ධති හා පාලන**

**--------------------**

විගණනයේ නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

.

| පද්ධතිය | අඩුපාඩු |
|---|---|
| (අ) ආදායම් | දේපළ තක්සේරුකර වරිපනම්බදු අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණු. |
| (ආ) ලැබිය යුතු ගිණුම් | හිඟ ආදායම් සහ ගාස්තු අයකිරීම සඳහා ආදායම් පරීක්ෂණ උපරිම මට්ටමින් පවත්වා නොතිබුණි. |
| (ඇ) වත්කම් | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි, මාර්ග, සුසානභූමි, සාතකාගාර බලපත්‍ර ගාස්තු ලේඛන ගත කර නොතිබුණි. |
| (ඈ) ගිණුම්කරණය | පොදු ලෙජරය සහ ප්‍රධාන ලෙජරය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |